# ඉස්ලාම් අංග සම්පූර්ණ වූ ජීවන සැලැස්මකි

සංස්කරණය : **අෂ්ෂෙක් එම්. එච්. මාෆි හුසෙයින්** (නලීමි)

මොලොවේ උපදින සෑම මිනිසෙකුම තමා ශ්‍රේෂ්ඨ මිනිසෙකු වශයෙන් අනෙක් ජනතාවට කරදර නොගෙන දෙන අන් අයට උපකාර කරන මිනිසෙකු වශයෙන් ජීවත් විය යුතුය යන්න ඔහු උපතින්ම ගෙන එන වගකීමක් වන්නේය. මෙය තේරුම් ගෙන ක්‍රියා කළ මිනිසාම තම ජීවිත කාලය අවසන් වීමෙන් පසුවද ජනතාවගේ සිත්වල නොමැකී ජීවත් වන්නේය. එබැවින් ලෝකයේ මිනිසා මිනිසෙකු වශයෙන් ජීවත් වීමට මිනිස් දුර්වලකම ගෙන් තොරවූ එක් ප්‍රබල බලවේගයක් ඔහුට මග පෙන්වන්නෙකු වශයෙන් සිටිය යුතුවේ. එම වගකීම නිවැරදිව, ක්‍රමානුකූලව ඉටු කර දෙන ධර්මය ඉස්ලාම් ධර්මය වන්නේය.

ඉස්ලාමය අංග සම්පූර්ණ වූ ජීවන සැලැස්මකි යන්නෙහි තේරුම ලෝකයේ මිනිසෙකු ඉපදීමේ පටන් ඔහු මරණයට පත්වන තුරු කෙසේ ජීවත් විය යුතුද යන්න එය මග පෙන්වන්නේය. මිනිස් දුර්වලකම් කිසිවක් නොමැති මිනිසාව මවා, ඔහු වටා ඇති ප්‍රපන්ජයද මවා මිනිසාගේ සෑම ක්‍රියාදාමයක් කෙරෙහිම සැලකිලිමත්ව සිටින්නාවූ අල්ලාහ් තම ශක්ති මහිමයෙන් මිනිසාට ජීවත් වීමට මග පෙන්වන්නක් වශයෙන් අල්කුර්ආනය පහළ කළේය. ග්‍රන්ථානු රූපයකින් දක්නට ලැබෙන්නාවූද, එහි අර්ථයන් එදිනෙදා ජීවන ක්‍රියාදාමයන් හට උචිත නොවන්නේය යනුවෙන් පවසන මිනිසාගේ සාමාන්‍ය චෝදනාවන්වලට පිළිතුරු දීමක් වශයෙන්ම එම ග්‍රන්ථයේ ඉගැන්වීම් එදිනෙදා ක්‍රියාදාමයන් හි ක්‍රියාවට නංවා මග පෙන්වන්නෙකු වශයෙන් මුහම්මද් නබි (ﷺ) තුමාණන්ව පහළ කරනු ලැබීය. මෙම අංශ දෙකම ඉස්ලාම් යැයි කියනු ලැබේ. එනම් මිනිසා කෙසේ ජීවත් විය යුතුද යනුවෙන් මග පෙන්වන්නෙකු වශයෙන් මිනිසාව මැවූ අල්ලාහ් තආලා විසින් පහළ කරනු ලැබූ මග පෙන්වන ග්‍රන්ථය වන අල් කුර්ආනය හා එදිනෙදා ක්‍රියාදාමන් හි ක්‍රියාවට නංවා මග පෙන්වූ නබි (ﷺ) තුමාණන්ගේ ජීවිතයම ඉස්ලාම් වන්නේය. මේ හැර වෙනත් කුමක් වුවත් එය ආගමික කරුණක් වශයෙන් සලකනු නොලබයි. එය ප්‍රතික්ෂේප කළ යුතු අළුත් දෙයක් වන්නේය. මෙයම නබි (ﷺ) තුමාණන් මෙසේ පවසා ඇත්තාහ.

من احدث في امرنا هذا ما ليس منه فهو رد (متفق عليه) **“යමෙකු මෙම ධර්මයේ (අල් කුර්ආන්, අල් හදීස්) නොමැති එක් කරුණක් අලුතින් ඇති කරන්නේද” එය ප්‍රතික්ෂේප කළ යුත්තකි**” යනුවෙන් පවසා ඇත්තාහ.

ඒ අනුව මිනිසාව මැවූ අල්ලාහ් මිනිසාගේ ස්වභාවය හොඳින් දන්නේය. එබැවින් එම මිනිසාට මග පෙන්වීමට එම දෙවියාම සුදුස්සා වන්නේය. මෙයම අල්ලාහ් අල් - කුර්ආනයේ (الا يعلم من خلق وهو اللطيف الخبير (الملك 14 **“මැවුම් කරුවා නොදන්නේද ඔහුගේ මැවුම් පිළිබඳව ඔහු ඒ පිළිබඳව පරිපූරණ දැනුම හා අත්දැකීම සතු තැනැත්තා වශයෙන් සිටින්නේය”.**

එම නිසා මෙම මගපෙන්වීමේ පදනම අනුව ජීවත්වීමේදී ඔහුගේ ජීවිතය දෙවියා විසින් පිළිගනු ලැබූ මුළු ජීවිතයම ඉබාදතයක් වශයෙන්ද එය පරිවර්තනය වන්නේය. දේව ආඥාවන් වන අල් කුර්ආනයේ හා නබි (ﷺ) තුමාණන්ගේ ජීවන රටාව වන හදීසය පදනම් කොට ගෙන ජීවිතය ගත කරන විට එය එක් වන්දනයක් වන්නේය. ලෝකයේ දක්නට ලැබෙන අනෙකුත් සියළුම ආගම්වල දක්නට නොලැබෙන එක් ශ්‍රේෂ්ඨ අංශයක් වශයෙන් මෙය කිව හැකිය.

අළුතින් යමක් ඇති කිරීමේදී ඒ සඳහා එක් මග පෙන්වන ග්‍රන්ථයක් එම නිපැයුම පිළිබඳව නිපැයුම්කරුවා විසින් ප්‍රධානය කරනු ලබන්නේද ඒ අයුරින්ම මිනිසා නැමැති නිපැයුම් වස්තුව පිළිබඳ මගපෙන්වන ග්‍රන්ථය වශයෙන් අල් කුර්ආනය පවතින්නේය.

මෙම ඉස්ලාමයේ ඉතා වැදගත් කරුණ වන්නේ විශ්වාසයයි. විශ්වාසය යනු ඉස්ලාමයේ ප්‍රධානතම නාලයයි. බහුතරයක් කරුණු විශ්වාසය පදනම් කොට ගෙනම පිහිටුවනු ලබන්නේය. මේ අනුව කෙනෙකු තමාව මුස්ලිමයෙකු වශයෙන් හඳුන්වා ගැනීමට අවශ්‍ය නම් ඔහු ලෞකික ජීවිතයේදී අනිවාර්යයෙන්ම විශ්වාස කළ යුතු කරුණු හයක් තිබේ. යමෙකු එම කරුණු හය පිළිබඳව සම්පූර්ණයෙන්ම විශ්වාස කරන්නේද ඔවුන් අනිවාර්යයෙන්ම ඉටු කල යුතු වගකීම් පහක් ඇත්තේය. මෙම අංශ දෙකම අල් කුර්ආනය මගපෙන්වන හා නබි තුමාණන් තම ජීවිතයේ සම්පූර්ණයෙන්ම ගෙන හැර පෙන්වා ජයගත් කරුණු වන්නේය.

විශ්වාස කළ යුතු කරුණු වශයෙන්

**01. අල්ලාහ් තආලාව (ඊමාන්) විශ්වාස කිරීම**

**02. මලාඉකාරුවන් පිළිබඳව විශ්වාස කිරීම**

**03. ආගම් පිළිබඳව විශ්වාස කිරීම**

**04. රසූල්වරුන් පිළිබඳව විශ්වාස කිරීම**

**05. අවසාන දිනය පිළිබඳව විශ්වාස කිරීම**

**06. යහපත හා අයහපත යන සියළුම කරුණු අල්ලාහ්ගේ කැමැත්ත අනුවම සිදුවන්නේය යනුවෙන් විශ්වාස කිරීම**

### 01. අල්ලාහ් තආලාව (ඊමාන්) විශ්වාස කිරීම

යාඥා කර නැමදීමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිදු දෙවියෙකු නොමැත යන අචල ලෙස විශ්වාස කිරීමයි. යාඥා කර නැමදීම යනුවෙන් පැවසීමේදී එය අල්ලාහ් තආලා වෙනුවෙන්ම යන චේතනාව මත නබි (සල්) තුමාණන්ගේ ක්‍රියාවන්ට පටහැනි නොවූ සියළුම කරුණු ඇතුලත් වේ. සියළුම කරුණු අල්ලාහ් තආලා වෙනුවෙන්ම යන චේතනාව මත ඉටු කිරීම යනාදියයි.

### 02. මලාඉකාවරුන් පිළිබඳව විශ්වාස කිරීම

අල්ලාහ් තආලා විසින් ආලෝකයෙන් මවන ලද සිය ඕනෑ එපාකම්වලින් ඇත්වූ අල්ලාහ්ගේ කැමැත්තට අනුව පමණක් ක්‍රියාත්මක වන එක් මැවුමක් වන්නේය. නියමිත සංඛ්‍යාවක් නොමැති අල්ලාහ්ගේ නියෝග අනුව ඔහුගේ කාර්යයන් ඉටු කිරීම ඔවුන්ගේ ප්‍රධානතම කාර්යයි. මෙය විශ්වාසයේ දෙවන අංශයයි.

### 03. ආගම් පිළිබඳව විශ්වාස කිරීම

අල්ලාහ් විසින් මිනිසාට යහමග පෙන්වීම සඳහා කලින් කලට සමහර ආගම් හා ඒ අනුව ක්‍රියාකරන සමහර යහමග පෙන්වන්නන් මෙලොවට පහළ කරනු ලැබිය. ඒවා පිළිබඳව විශ්වාස කිරීමයි. අල් කුර්ආනය හා මුහම්මද් නබි (ﷺ) තුමාණන්ව පහළ කළ අල්ලාහ් ඒ අයුරින්ම එයට පෙරද "සබූර්" නැමැති ආගම දාවූද් නබි තුමාටද .තව්රාත් නැමැති ආගම මූසා නබි තුමාටද ඉන්ජීල් නැමැති ආගම ඊසා නබි තුමාටද පහළ කරනු ලැබිය. මෙසේ අල්ලාහ් විසින් පහළ කරනු ලැබූ ආගම් අතරින් අවසානම ස්ථානය මුහම්මද් නබි (ﷺ) තුමාණන්ට හා එතුමාට පහළ කරනු ලැබූ අල් කුර්ආනයට හිමිවන්නේය. මේ පිළිබඳව විශ්වාස කිරීම ඊමානයේ තුන්වන අංශයයි.

## 04. රසූල්වරුන් පිළිබඳව විශ්වාස කිරීම

අල්ලාහ් විසින් කලින් කලට මිනිසාට මග පෙන්වීම සඳහා ආගම් පහළ කරනු ලැබූ බව විශ්වාස කිරීම වගේම එය ක්‍රියාවට නංවා පෙන්වීමට සමහර වක්තෘන්වරුන්වද අල්ලාහ් විසින් මෙලොවට පහළ කරනු ලැබිය යනුවෙන් විශ්වාස කළ යුතුයි.

## 05. අවසාන දිනය පිළිබඳව විශ්වාස කිරීම

ලෝකයේ අල්ලාහ් විසින් මවන ලැබූ ප්‍රථම මැවුමේ පටන් ලෝක විනාශය දක්වා ජීවත් වූ සියළුම මැවුම් ලෝක විනාශයෙන් පසු එක් ස්ථානයකට ඒක රාශි කොට ඔවුන්ගේ ලෞකික ජීවිතය පිළිබඳව විභාග කර විසඳුම් ලබා දෙන දිනය එනම් ලෝකයේ ජීවත් වන සෑම මිනිසෙකුගේම ජීවිතය පිළිබඳව විභාග කොට ඔහුගේ ජීවිතයට අදාල නිවැරදි විසඳුම් ලබා දෙනු ලැබේ. යහපත් මිනිසාට ඔහුට අයත් දීමනාවන්ද අපරාධකරුවෙකුට ඔහුට අයත් දඬුවම් ද දෙනු ලබන එක් විනිශ්චය දිනයකි. මේ පිළිබඳව ද විශ්වාස කිරීම එක් වැදගත් විශ්වාසයකි.

## 06. යහපත හා අයහපත යන සියළුම කරුණු අල්ලාහ්ගේ කැමැත්ත අනුවම සිදුවන්නේය යනුවෙන් විශ්වාස කිරීම

ලෝකයේ සිදුවන කුමන කාර්යයක් වුවද එය අල්ලාහ්ගේ කැමැත්ත අනුවම සිදුවන බව දැඩි ලෙස විශ්වාස කිරීම. මෙම විශ්වාසයම ලෞකික ජීවිතයේදී මුහුණ දීමට සිදුවන සියළුම කරුණුවලට සැනසීමක් වශයෙන් තිබෙන්නේය යන්නෙහි කිසිදු සැකයක් නොමැත. මෙය විශ්වාස කිරීම ඊමානයේ හයවන වගකීමයි.

ඉහත සඳහන් කරුණු හයම පිළිගත් මිනිසාව අපි විශ්වාසවන්තයා නැතහොත් ඊමාන්ධාරියා යනුවෙන් පවසන්නෙමු. මෙසේ මෙම කරුණු හයම විශ්වාස කළ එක් විශ්වාසවන්තයෙන් අනිවාර්යයෙන්ම ඉටු කළ යුතු වගකීම් පහක් දක්නට ලැබෙන්නේය. ඒවා නම්

01. **කලිමා**
02. **සලාතය**
03. **සව්මය**
04. **සකාත්**
05. **හජ්** යනුවෙන් හඳුන්වනු ලැබ ඇත.

## 01. කලිමා

අල්ලාහ් හැර වෙනත් කිසිදු දෙවියෙකු නොමැත යනුවෙන් හා මුහම්මද් නබි (සල්) තුමාණන් අල්ලාහ්ගේ ගැත්තෙකු හා වක්තෘවරයෙකු වන්නේය යනුවෙන් පවසා දෙවියා සමඟ ඇති කරගන්නා ගිවිසුම කලිමා යැයි කියනු ලැබේ.

## 02. සලාතය

කලිමා නැමැති ගිවිසුම පිළිගත් මිනිසා එහි ඊළඟ පියවර වශයෙන් ප්‍රථමයෙන් දෙවියා විසින් දිනකට පස්වේලක් බැඟන් අනිවාර්ය කරනු ලැබූ සලාතය ඉටුකල යුතුය. මරණයෙන් පසුව ඇති විනිශ්චය දිනයේදී පවා අල්ලාහ් විසින් අසනු ලබන ප්‍රථම ප්‍රශ්නයද සලාතය පිළිබඳවය. අනුමැතිය දී ඇති සමහරුන්ට අනුමැතිය දී ඇති සමහර වේලාවන්වලදී හැර අනෙකුත් සියළු දෙනා වෙනුවෙන්ම අනිවාර්ය කරන ලද එක් වැදගත් වගකීමක් ලෙස මෙය කිව හැකිය.

## 03. සව්මය

වසරේ එක් මාසයක් මුළු ලොවේ වෙසෙන සියළුම මුස්ලිම්වරු නියමිත ඉස්ලාමීය මාස අනුව නමවන මාසය වන රමළාන් මාසය යනුවෙන් සඳහන් කරනු ලබන මාසයේ මුළුල්ලේම හිමිදිරි උදෑසන පටන් හිරු බසින තුරු කෑම හා බීම යනාදියෙන් වැළකී අල්ලාහ් වෙනුවෙන් තමාව පාලනය කර ගන්නාවූ වගකීමක් ලෙස මෙය හැඳින්විය හැකිය. මෙයද නියමිත අයුරින් ගර්භණී කාන්තාවන්, රෝගීන්, දීර්ඝ ගමන්වල යෙදී සිටින සංචාරකයින් හැර අනෙකුත් සියළු දෙනාහටම අනිවාර්ය කරනු ලැබූ පොදු වගකීමකි.

## 04. සකාත්

ධනවත් අය තමන් උපයාගත් වත්කමෙන් දුගියන් හට දෙනු ලබන බද්දකි. තමා උපයාගත් වත්කමෙන් තම වියදමට අමතරව වැඩිපුර ඇති ධනය 10ගෑ පවුම් රත්තරං වල වටිනාකමට වැඩියෙන් එක් වසරක් තමා සතුව තිබෙන්නේ නම් ඒ වෙනුවෙන් 2½ සකාත් දිය යුතුය.

අල් කුර්ආනයේ අල්ලාහ් නියම කර ඇති කණ්ඩායම් අටට අයත් පුද්ගලයන් හට නැතහොත් එයින් එක් කණ්ඩායමකට සෑහෙන ප්‍රමාණයකට බෙදා හැරිය යුතුය. මෙහි ප්‍රධාන පරමාර්ථය වන්නේ දුගී බව තුරන් කිරීමයි. දුගියන් ධනවත් කෙරෙහි තබා ඇති ක්‍රෝධය නැති කිරීම මෙහි එක් පරමාර්ථයකි. එක් වතාවක් සකාත් ලබාගත් මිනිසා ඊළඟ වතාවේදී සකාත් ප්‍රධානය කරන තැනැත්තෙකු වශයෙන් පත්විය යුතුය යන්න මෙහි වැදගත් පරමාර්ථයකි.

## 05. හජ්

මෙය වත්කම් හා හැකියාවන් ඇති නිරෝගී තත්වයෙන් පසුවන අයට පමණක් වසරේ එක් නියමිත කාල පරිච්ඡේදයකදී සවුදි අරාබියාවේ මක්කා ප්‍රදේශයේ ඇති කඃබාව බැහැ දැකීමයි. වත්කම් පොහොසත්කම් හා නිරෝගීභාවය ඇති අය ජීවිතයේ එක් වතාවක් හෝ එහි ගමන් කොට මෙම වගකීම ඉටු කළ යුතුය. නියමිත අයට පමණක් සීමාකර ඇති වගකීමක් ලෙස මෙය කිව හැකිය. වත් පොහොසත්කම් නොමැති අයගෙන් අවසන් දිනයේදී මේ පිළිබඳව ප්‍රශ්න කිරීමද නොකෙරෙනු ඇත.

එබැවින් පොදුවේ අප ඉස්ලාම් යන්න පිළිබඳව සැලකීමක්වීමේදී එය අල්ලාහ් විශ්වාස කොට ඔහු විසින් පහළ කරන ලැබූ අල් කුර්ආනය හා ඒ අනුව ජීවත්වී මග පෙන්වූ මුහම්මද් නබි (සල්) තුමාණන්ව පිළිගෙන කරනු හයක් පිළිබඳව විශ්වාස කොට අනිවාර්ය කරන ලැබ ඇති වගකීම් පහ ඒ අයුරින්ම ඉටු කිරීමද වන්නේය. එසේ කිරීමේදී ලෝකයේ විසූ සත්‍ය මුස්ලිම් වශයෙනුත් පරලොව විනිශ්චය දිනයේදී ජයගෙන අල්ලාහ්ගේ දායාදය වන ස්වර්ගයට පිවිසීමේ භාග්‍යද හිමිකරගත හැකිය.

***එවැනි යහපත් මිනිසුන් ලෙස ජීවත්වීමට අප සැමට අල්ලාහ්ගේ අල්ලාහ්ගේ ආශිර්වාදය ලැබේවා.***

واخـر دعوانـا ان الحمـد لله رب العـالمين